Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 13

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 12.0 - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
නිපුණතා මට්ටම 12.4.1 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

1.සීමිත වාරියපොළ පොදු සමාගමේ 2019/04/01 දිනට හිමිකම් අයිතම පහත දැක්වේ.

| | රු.000 |
|---|---|
| රු.50 සාමාන්‍ය කොටස් (2,000,000) | 100,000 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය (ඉඩම්) | 4,000 |
| පොදු සංචිත | 22,500 |
| රඳවා ගත් ඉපැයුම් | 3,500 |

2.සීමිත වාරියපොළ පොදු සමාගමේ 2020/03/31 දිනට ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් උපුටා ගත් තොරතුරු

| | |
|---|---|
| කාලච්ඡේදයේ ශුද්ධ ලාභය (බදු පසු) | රු.6,500,000 |
| ඉඩම වසර තුළ ප්‍රත්‍යාගණනයෙන් ලැබූ අතිරික්තය | රු.2,000,000 |
| මුළු විස්තීර්ණ ආදායම | රු.8,500,000 |

3.සීමිත වාරියපොළ පොදු සමාගමේ 2020.03.31න් අවසන් වසර තුළ හිමිකම වෙනස් වීමට ඉවහල් වූ ගනුදෙනු පහත දැක්වේ.

1.2019.04.01 දින රු.50 සාමාන්‍ය කොටස් 50,000ක් මහජනයා වෙත නිකුත් කිරීම.කොටස් 60,000කට මුදල් ලැබී,අයදුම්කරුවන් අතර කොටස් සමානුපාතිකව විභජනය කර වැඩිපුර ලද මුදල් ආපසු යැවීය.

2.2019.07.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් 2019.04.01 කොටස් නිකුතුවට පෙර තිබූ සෑම සාමාන්‍ය කොටස් 5:1 බැගින් රු.50ක ප්‍රතිෂ්ඨාවක් මත සංචිත ප්‍රාග්ධනීකරණය සිදු කිරීම.මේ සඳහා පොදු සංචිත භාවිත කිරීමට තීරණය විය.

3.2019.10.01 දින රු.50 සාමාන්‍ය කොටස් 20,000ක්,2019.04.01 දින සිට සෑම සාමාන්‍ය කොටස් හිමිකමකට ම 4:1 අනුපාතයට ලැබෙන පරිදි හිමිකම් නිකුතුවක් සිදු කිරීම.සියලු කොටස්ලාභීහු හිමිකම් කොටස් ලබා ගත්හ.

4.අධ්‍යක්ෂ මණ්ඩලය 2020.03.31 දින මේ වසරේ ලාභයෙන් රු.1,000,000ක් පොදු සංචිතයට මාරු කිරීමට,සාමාන්‍ය කොටස් හිමිකම් සඳහා රු.3,000,000ක අවසන් ලාභාංශයක් යෝජනා කර ඇත.කෙසේ වුවද වසර තුළ සාමාන්‍ය කොටස් හිමියන්ට රු.200,000ක ලාභාංශයක් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

1.සීමිත වාරියපොළ පොදු සමාගමේ 2020.03.31න් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කිරීම.
2.සීමිත වාරියපොළ පොදු සමාගමේ 2019.03.31න් අවසන් වසරට ඉහත ගනුදෙනු හා සිද්ධීන් තුළින් අදාළ ගිණුම්කරණ සටහන් දක්වන්න.
3.ඉහත සිද්ධීන් වාර්තා කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් හා ලෙජර් ගිණුම් දැක්වීම.